ජනාධිපතිවරයා විසින්, උපලේඛනවල සඳහන් කොමිෂන් සභා සහ ධුර සම්බන්ධයෙන් පත්කිරීම් සිදුකරනු ලැබිය යුතු බව.

41අ. (1) මේ ව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරයා සහ සාමාජිකයන් ද, මේ ව්‍යවස්ථාවේ II වන උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ සඳහන් ධුරවලට පත්කළ යුතු තැනැත්තන් ද, ජනාධිපතිවරයා විසින් එකී උපලේඛනවල සඳහන් කොමිෂන් සභාවලට සහ ධුරවලට පත්කරනු ලැබිය යුත්තේ ය. ජනාධිපතිවරයා විසින් එකී පත්කිරීම් සිදුකිරීමේ දී—

(අ) අග්‍රාමාත්‍යවරයා;

(ආ) කථානායකවරයා;

(ඇ) විරුද්ධ පක්ෂයේ නායකවරයා;

(ඈ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විය යුතු, අග්‍රාමාත්‍යවරයාගේ නාමිකයකු; සහ

(ඉ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විය යුතු, විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ නාමිකයකු,

යන අයගෙන් සමන්විත (මේ ව්‍යවස්ථාවේ මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාර්ලිමේන්තු සභාවක නිරීක්ෂණ ඉල්ලා සිටීම කළ යුත්තේ ය:

එසේ වුව ද, ඉහත (ඈ) සහ (ඉ) ඡේද ප්‍රකාර පත්කරනු ලබන නාමිකයන්, ඉහත (අ), (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව සඳහන් තැනැත්තන් අයත් වන ජන කොට්ඨාස නොවන්නා වූ ජන කොට්ඨාසවලට අයත්වන බව සහතිකවන ආකාරයට නම් කළ යුත්තේ ය.

## I වන උපලේඛනය

1. මැතිවරණ කොමිෂන් සභාව.
2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
3. ජාතික පොලිස් කොමිෂන් සභාව.
4. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
5. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව.
6. මුදල් කොමිෂන් සභාව.
7. සීමා නිර්ණය කොමිෂන් සභාව.